SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 12 - 2026

22 | S | I

විභාග අංකය: .....

කාලය පැය 03 යි
අමතර කියවීම් කාලය: මි. 10 යි.

භූගෝල විද්‍යාව - I

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. **I කොටස** බහුවරණ ප්‍රශ්න **40 කින්** සමන්විත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- **I කොටසේ** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- **II** කොටසෙ හි ප්‍රශ්න **දෙකට** ම පිළිතුරු සැපයිය යුතු ය.
- **III කොටස** ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- **I, II** සහ **III** කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

I කොටස

(01) භූ ලක්ෂණ සිතියම්වල තනි වර්ණයකින් නිරූපණය කරනු ලබන්නේ,
(1) රබර් වගාව හා වෙනත් වැවිලි ය.
(2) තේ වගාව හා ඉදිකළ ප්‍රදේශ ය.
(3) වී වගාව හා ගෙවත්ත ය.
(4) පොල් වගාව හා තේ වගාව ය.
(5) ඉදිකළ ප්‍රදේශ හා රබර් වගාව ය.
(.....)

(02) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ කොහේ ද?
(1) හවායි දූපත්
(2) ඇසෙන්ෂන් දූපත්
(3) කොලරාඩෝ ස්ප්‍රින්ග්
(4) ක්වාලෙයින් දූපත්
(5) දියාගෝ ගාර්ෂියා දූපත්
(.....)

(03) ජෝන් ස්නෝ නම් වෛද්‍යවරයා විසින් සිතියම්ගත තොරතුරු පද්ධතියක් භාවිත කරනු ලැබුවේ කුමක් සඳහා ද?
(1) ලන්ඩන් නගරයේ සරම්ප වසංගතයේ පැතිරීම අධ්‍යයනය කිරීමට
(2) පැරිස් නගරයේ කොළරා වසංගතයේ පැතිරීම අධ්‍යයනය කිරීමට
(3) මොස්කව් නගරයේ පාචනය වසංගතයේ පැතිරීම අධ්‍යයනය කිරීමට
(4) ලන්ඩන් නගරයේ කොළරා වසංගතයේ පැතිරීම අධ්‍යයනය කිරීමට
(5) පැරිස් නගරයේ මහාමාරිය වසංගතයේ පැතිරීම අධ්‍යයනය කිරීමට
(.....)

(04) ශ්‍රී ලංකාවේ ගොවිබිම් සංවර්ධනය සඳහා යොදා ගනු ලැබූ සිතියම් ශ්‍රේණිය මින් කුමක් ද?
(1) 1 : 5,000
(2) 1 : 10,000
(3) 1 : 25,000
(4) 1 : 50,000
(5) 1 : 100,000
(.....)

(05) දුරස්ථ සංවේදයේ දී (RS) භාවිත කරන අභ්‍යවකාශ වේදිකාවක් ලෙස භාවිත කරනු ලබන්නකි.
(1) රොකට්
(2) ගුවන් යානා
(3) බැලූන්
(4) අහස් නැව්
(5) හෙලිකොප්ටර්
(.....)

(06) භූ ලක්ෂණ සිතියමක 'මුහුණත තොරතුරක්' මෙන්ම 'පර්යන්ත තොරතුරක්' ලෙස ද දැක්වෙන්නේ මින් කුමක් ද?
(1) දිශාව
(2) පරිපාලන මායිම්
(3) ගොඩනැගිලි
(4) භූ විෂමතාව
(5) යාබද සිතියම්
(.....)

(07) 1:50,000 භූ ලක්ෂණ සිතියම් ශ්‍රේණියේ සිතියම් පත්‍ර අංක 01 හා 92 පිළිවෙළින් නිවැරදි ව නම් කර ඇති වරණය තෝරන්න.
(1) යාපනය - මාතර
(2) පේදුරු තුඩුව - තිස්සමහාරාම
(3) මනිපායි - තංගල්ල
(4) මනිපායි - මාතර
(5) යාපනය - තංගල්ල
(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(08) භූගෝලීය තොරතුරු පද්ධතියක (GIS) ආදාන උපාංග දෙකක් පමණක් දැක්වෙන වරණය තෝරන්න.
(1) අංකන ඵලකය - චුම්භක තැටි
(2) අංකන ඵලකය - සංදර්ශකය
(3) සුපිරික්සනය - මධ්‍ය සැකසුම් ඒකකය
(4) මුද්‍රණ යන්ත්‍රය - සංදර්ශකය
(5) සසම්භාවී මතකය - තිර සංඛ්‍යාංකනය
(.....)

(09) සංඛ්‍යා දත්ත හා තොරතුරු දෘශ්‍යාත්මකව නිරූපණය කිරීමට හා ඒවා පහසුවෙන් අවබෝධ කරගැනීම සඳහා භාවිත කර ගන්නා ප්‍රායෝගික භූගෝල විද්‍යාත්මක ක්‍රම ශිල්පයක් වන්නේ,
(1) සිතියම් ය.
(2) පරිගණක ක්‍රමශිල්ප ය.
(3) සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමශිල්ප ය.
(4) ප්‍රස්තාර ය.
(5) ඡායාරූප හා ප්‍රතිබිම්බ ය.
(.....)

(10) මුහුදේ හෝ ගොඩබිම හෝ ගුවනේ හෝ ගමන් කරන අවස්ථාවල දී තම ගමන් මාර්ගය සොයා ගැනීම සඳහා භාවිත කරනු ලබන සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පය හඳුන්වනු ලබන්නේ,
(1) යාන්ත්‍රණය ලෙස ය.
(2) අංකිතකරණය ලෙස ය.
(3) සමුද්ධරණය ලෙස ය.
(4) යාත්‍රණය ලෙස ය.
(5) සිතියම්කරණය ලෙස ය.
(.....)

(11) ශ්‍රී ලංකාවේ භූමියෙන් වැඩි ප්‍රමාණයක දැකිය හැකි පාෂාණ වර්ගය වන්නේ,
(1) ජුරාසික පාෂාණ යි.
(2) ප්‍රාග් කේම්බ්‍රීය පාෂාණ යි.
(3) මයෝසීන පාෂාණ යි.
(4) සිලූරියන් පාෂාණ යි.
(5) ප්ලෙයස්ටොසීන පාෂාණ යි.
(.....)

(12) හෙක්ලා - විසූවියස් - ක්‍රැකටෝවා යන යමහල් පිහිටා ඇති රටවල් නිවැරදි ව අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ග්‍රීන්ලන්තය - සිසිලිය - ඉන්දුනීසියාව
(2) තායිලන්තය - නවසීලන්තය - අයර්ලන්තය
(3) අයිස්ලන්තය - ජපානය - මෙක්සිකෝව
(4) අයිස්ලන්තය - ඉතාලිය - ඉන්දුනීසියාව
(5) ඇලස්කාව - ඉතාලිය - චිලී
(.....)

(13) භෞතික භූගෝල විද්‍යාවට අයත් උප විෂය ක්ෂේත්‍රයකි.
(1) සංවර්ධන භූගෝල විද්‍යාව
(2) ග්‍රාමීය භූගෝල විද්‍යාව
(3) ආර්ථික භූගෝල විද්‍යාව
(4) කාර්මික භූගෝල විද්‍යාව
(5) පුරා භූගෝල විද්‍යාව
(.....)

(14) මෙසෝගෝලයේ ව්‍යාප්තිය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) කි.මී. 8 - කි.මී. 16 අතර
(2) කි.මී. 16 - කි.මී. 50 අතර
(3) කි.මී. 50 - කි.මී. 80 අතර
(4) කි.මී. 80 - කි.මී. 100 අතර
(5) කි.මී. 100 - කි.මී. 120 අතර
(.....)

(15) වී වගාව සඳහා වඩාත් යෝග්‍ය පස් වර්ගය කුමක් ද?
(1) දියළු පස
(2) ග්‍රැමුසොල්ස් පස
(3) රෙගොසොල්ස් පස
(4) රතු දුඹුරු පස
(5) ගොහොරු පස
(.....)

(16) මහාද්වීපික ග්ලැසියර් නිධි සාදනයෙන් නිර්මාණය වන භූ රූපයකි.
(1) ලොයෙස්
(2) මොරේන
(3) බහාඩා
(4) එස්කර්
(5) ඩෙල්ටා
(.....)

(17) පෘථිවිය මතුපිට තිරස් උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම් ප්‍රධාන වශයෙන් ඇති වන්නේ,
(1) මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව ය.
(2) භූතල සුළං නිසා ය.
(3) අක්ෂාංශගත පිහිටීම අනුව ය.
(4) සූර්ය සුළං නිසා ය.
(5) ගොඩබිම හා සාගරවල ව්‍යාප්තිය
(.....)

(18) උතුරු හා දකුණු අක්ෂාංශ 30^{0} ආශ්‍රිත ව පිහිටා ඇති ගෝලීය පීඩන තීරය මින් කුමක් ද?
(1) සමක අඩු පීඩන තීරය
(2) උප නිවර්තන වැඩි පීඩන තීරය
(3) සෞම්‍ය කලාපීය අඩු පීඩන තීරය
(4) ධ්‍රැවක වැඩි පීඩන තීරය
(5) ඩොල්ඩ්‍රම් තීරය
(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(19) ශ්‍රී ලංකාවට බලපාන ඊසාන දිග මෝසම් වර්ෂාවේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයකි
(1) වර්ෂය පුරාම ක්‍රියාත්මක වේ.
(2) අකුණු සහිත වැසි ලැබේ.
(3) ගංවතුර හා නායයෑම් බහුල ව ඇති කරයි.
(4) බෙංගාල බොක්කේ අඩු පීඩන තත්ත්ව හේතුවෙන් නිර්මාණය වේ.
(5) දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට වැඩිපුර වැසි ලැබේ. (.....)

(20) ගංගාවක පරිණත අවස්ථාවේ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) ආංශික සංඝර්ෂණය සිදු වේ.
(2) ජලයේ ප්‍රවේගය වැඩි ය.
(3) බාදිත භූ රූප නිර්මාණය කරයි.
(4) සිරස් සංඝර්ෂණය ඉහළ ය.
(5) ජල ප්‍රමාණය අඩු ය. (.....)


(21) ගුටෙන්බර්ග් අසන්තතිය දෙපස පිහිටා ඇති ස්තර දෙක දැක්වෙන වරණය තෝරන්න.
(1) මහාද්වීපික කබොල - සාගරික කබොල
(2) කබොල - ඉහළ ප්‍රාවරණය
(3) ඉහළ ප්‍රාවරණය - පහළ ප්‍රාවරණය
(4) පහළ ප්‍රාවරණය - පිටත හරය
(5) පිටත හරය - ඇතුළත හරය (.....)

(22) ලොව මුල් ම දේශගුණ වර්ගීකරණයක් ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් ද?
(1) ස්ට්‍රාලර්
(2) ඇරිස්ටෝටල්
(3) ටොලමි
(4) තෝන්වේට්
(5) මිලර් (.....)

(23) පෘථිවියේ ඇති සමස්ත ජල පරිමාව ඝන කිලෝමීටර මිලියන,
(1) 710 කි.
(2) 1250 කි.
(3) 1386 කි.
(4) 1596 කි.
(5) 1836 කි. (.....)

(24) සාගරික ප්‍රදේශවල යමහල් ක්‍රියාකාරිත්වය නිසා නිර්මාණය වී ඇති යමහල් දූපත් සමූහයකි.
(1) හවායි දූපත්
(2) නිකොබාර් දූපත්
(3) මැඩගස්කරය
(4) බැෆින් දූපත්
(5) තායිවානය (.....)

(25) මෙහි A හා B මගින් දැක්වෙන විභේද වර්ග දෙක නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.



(1) A කුට්ටි - B සුවිභේදය
(2) A සෝපාන - B උළැඟි
(3) A සාමාන්‍ය - B උඩුකුරු
(4) A කුට්ටි - B සෝපාන
(4) A සෝපාන - B කුට්ටි (.....)

(26) ලතින් ඇමරිකානු කලාපයේ ඉහළ ම නාගරීකරණයක් සහිත රටක් දැක්වෙන වරණය තෝරන්න.
(1) මෙක්සිකෝව
(2) වෙනිසියුලාව
(3) කොළොම්බියාව
(4) උරුගුවේ
(5) සූරිනෑම් (.....)

(27) වයස අවුරුදු 60 හා ඊට ඉහළ ජන සංඛ්‍යාව වයස අවුරුදු 15 ට අඩු ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම,
(1) වියපත් දර්ශකය යි.
(2) සාඵල්‍යතා අනුපාත යි.
(3) මර්ත්‍යතාව යි.
(4) ළමා අනුපාත යි.
(5) ශ්‍රම බලකාය යි. (.....)

(28) මිනිසා ස්ථිර කෘෂිකර්මයේ හා සත්ත්ව පාලනයේ යෙදෙමින් ස්ථිර නිවාස තනා ගනිමින් ගම්මානවල පදිංචි වීම ආරම්භ කරන ලදැ යි සැලකෙන යුගය කුමක් ද?
(1) සංචාරක එඬේර යුගය
(2) ආදි ශිලා යුගය
(3) නව ශිලා යුගය
(4) පූර්ව ශිලා යුගය
(5) කාර්මික යුගය (.....)

(29) වර්ෂ 1943 දී හරිත විප්ලවයේ ආරම්භය සිදු වූයේ,
(1) කැනඩාවෙනි.
(2) මෙක්සිකෝවෙනි.
(3) බ්‍රසීලයෙනි.
(4) පාකිස්ථානයෙනි.
(5) ආර්ජන්ටිනාවෙනි. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(30) පුමිතිරි අනුපාතිකයෙන් ප්‍රකාශ වන්නේ,
(1) පුරුෂයන් 100 කට සිටින ස්ත්‍රීන් සංඛ්‍යාව යි.
(2) ස්ත්‍රීන් 1000 කට සිටින පුරුෂයන් සංඛ්‍යාව යි.
(3) පුරුෂයන් 1000 කට සිටින ස්ත්‍රීන් සංඛ්‍යාව යි.
(4) ස්ත්‍රීන් 100 කට සිටින පුරුෂයන් සංඛ්‍යාව යි.
(5) ළමුන් 100 කට සිටින වැඩිහිටියන් සංඛ්‍යාව යි. (.....)

(31) ජනාවාසයක ප්‍රධානත ම සංරචකය වන්නේ,
(1) පරිසරය යි. (3) ජාලයන් ය. (5) ස්වාභාවික පරිසරය යි.
(2) මිනිසා ය. (4) ආවරණ යි. (.....)

(32) මහාද්වීප අනුව අඩු ම ජන සංඛ්‍යා ව්‍යාප්තියක් දක්නට ලැබෙන්නේ,
(1) යුරෝපයේ ය. (3) දකුණු ඇමරිකාවේ ය. (5) ආසියාවේ ය.
(2) උතුරු ඇමරිකාවේ ය. (4) ඔෂනියාවේ ය. (.....)

(33) නාගරීකරණ ප්‍රතිශතය 100%ක් ලෙස වාර්තා වන රටකි.
(1) ජපානය (3) සිංගප්පූරුව (5) ජර්මනිය
(2) දකුණු කොරියාව (4) ප්‍රංශය (.....)

(34) බටහිර ජාතීන්ගේ ආගමනය ශ්‍රී ලංකාවේ ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි ඇති කරන ලද බලපෑමක් දැක්වෙන වරණය තෝරන්න.
(1) නිරිත දිග ප්‍රදේශවලට ජනාවාස සංකේන්ද්‍රණය වීම.
(2) වියළි කලාපීය ප්‍රදේශවලට ජනාවාස සංකේන්ද්‍රණය වීම.
(3) මධ්‍ය කඳුකරය දෙසට ජනාවාස සංකේන්ද්‍රණය වීම.
(4) උතුරු දෙසට ජනාවාස සංකේන්ද්‍රණය වීම.
(5) වෙරළබඩ ප්‍රදේශවලට ජනාවාස සංකේන්ද්‍රණය වීම. (.....)

(35) 2024 වර්ෂයේ ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වැඩි ම දිස්ත්‍රික්කය කුමක් ද?
(1) ගම්පහ (3) ගාල්ල (5) මහනුවර
(2) කළුතර (4) කොළඹ (.....)

(36) 'මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීම' භූගෝල විද්‍යාව ලෙස අර්ථ දක්වනු ලැබුවේ,
(1) රිචඩ් හාර්ට්ෂොන් ය. (4) මොරිස් ඩේවිස් ය.
(2) කාල් රිටර් හා වොන් හම්බෝල්ට් ය. (5) ඔස්ටින් මිලර් හා තෝන්වේට් ය.
(3) විලැඩිමියර් කෙපන් හා ගයිගර් ය. (.....)

(37) සංක්‍රමණ කෙරෙහි බලපාන ඇදගැනීමේ සාධකයකි.
(1) රළු භූ විෂමතාව (3) සෞම්‍ය දේශගුණය (5) සිවිල් යුද්ධ
(2) විරැකියාව (4) දරිද්‍රතාව (.....)

(38) ශ්‍රී ලංකාවේ නාගරීකරණ මට්ටම පහළ බැසීමට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැක්කේ,
(1) 1953 ජන සංගණනයක් පැවැත්වීම යි.
(2) නගර සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වීම යි.
(3) ජන සංඛ්‍යාව වැඩි වීම යි.
(4) 1987 දී ප්‍රාදේශීය සභා පනත නිසා සිදු වූ වෙනස් වීම යි.
(5) ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්තිය වැඩි වීම යි. (.....)

(39) මධ්‍යම යුරෝපයේ බණ්ඩිත ව විහිදුණු නාගරික කලාපය හඳුන්වනු ලබන නම කුමක් ද?
(1) ග්‍රීන් බනානා (3) ගෝල්ඩන් බනානා (5) බ්ලූ බනානා
(2) බොස්-වොෂ් (4) චිපිට්ස් (.....)

(40) පුද්ගලයකුට හෝ කුටුම්භයකට සෑම කාලයක දී ම ආහාර ලබා ගැනීමට ඇති හැකියාව හඳුන්වනු ලබන්නේ,
(1) ක්‍රය ශක්තිය ලෙස ය. (4) ආහාර වෙත ප්‍රවේශ වීම ලෙස ය.
(2) ආහාර උපයෝජ්‍යතාව ලෙස ය. (5) ආහාර ස්ථායිතාව ලෙස ය.
(3) සමානාත්මතාව ලෙස ය. (.....)

❋ ❋ ❋ ❋

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023

Third Term Test - Grade 12 - 2023

භූගෝල විද්‍යාව - I

- **II** කොටසෙහි ප්‍රශ්න **දෙකට** ම පිළිතුරු සැපයිය යුතු ය.
- **III කොටස** ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50,000 භූ ලක්ෂණ සිතියමක කොටසක් ද, ලෝක ආකෘති සිතියමක් ද සපයනු ලැබේ.

II කොටස

(01) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ අංක 53 කෑගල්ල භූ ලක්ෂණ සිතියමේ කොටසක් ඔබට සපයා ඇත. එම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) A අක්ෂරයෙන් දැක්වෙන ලක්ෂණය නම් කරන්න. (ලකුණු 1)

(ii) B - B ලක්ෂණය කුමක් ද? (ලකුණු 1)

(iii) ප්‍රධාන ගංගාව දිගේ විහිදී ඇති පරිපාලන මායිම කුමක් ද? (ලකුණු 1)

(iv) C චතුරස්‍රය තුළ ඇති පොදු සේවා සපයන ආයතන **තුනක්** නම් කරන්න. (ලකුණු 3)

(v) සිතියම් ප්‍රදේශය තුළ ප්‍රමුඛ ව්‍යාපාරික බෝග වගාව කුමක් ද? (ලකුණු 1)

(vi) D චතුරස්‍රය තුළ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණය නම් කරන්න. (ලකුණු 1)

(vii) x සිට y දක්වා ඇති මාර්ග කොටසේ දුර ආසන්න වශයෙන් කොපමණ ද? (ලකුණු 1)

(viii) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන මාර්ග වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 2)

(ix) භූ විෂමතාව හා මාර්ග ජාලය අතර ඇති සම්බන්ධතාව කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(x) සිතියම් ප්‍රදේශයේ බෝග වගාවේ ව්‍යාප්තිය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 4)

(02) සම්මත සංකේත හා වර්ණ යොදාගනිමින් මතු සඳහන් දෑ සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

- කැස්පියන් මුහුද
- හවායි දූපත්
- නිව්යෝර්ක්
- මහා බෙදුම් කඳු
- ෆින්ලන්තයේ අගනුවර
- ඉරාන-ඇමරිකා සාම සාකච්ඡා පැවැත්වූ රට
- ටිටිකාකා විල
- ඩෙන්මාර්ක් සමුද්‍ර සන්ධිය
- සහරා කාන්තාරය
- මයෝන් යමහල

(ලකුණු 10)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

III කොටස

(03) (i) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) යන්න හඳුන්වන්න. (ලකුණු 2)

(ii) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ ඇන්ටනා මධ්‍යස්ථාන පිහිටි ස්ථාන නිවැරදි ව නම් කරන්න. (ලකුණු 4)

(ii) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ පාලක කොටස පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 4)

(iv) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය භාවිත කිරීමේ දී මතුවිය හැකි ගැටළු **තුනක්** සඳහන් කර ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 5)

(04) (i) භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) යන්න හඳුන්වන්න. (ලකුණු 2)

(ii) (a) භූගෝලීය තොරතුරු පද්ධතියක භාවිත කරන දත්ත ආකෘති වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 1)

(b) ඉන් එක් දත්ත ආකෘතියක් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 3)

(iii) භූගෝලීය තොරතුරු පද්ධතියක ප්‍රතිදාන උපක්‍රම **දෙකක්** හා මෘදුකාංග **දෙකක්** නම් කරන්න. (ලකුණු 4)

(iv) භූගෝලීය තොරතුරු පද්ධතියක භාවිත කිරීමේ වාසි **තුනක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)


(05) (i) දුරස්ථ සංවේදය (RS) යන්න හඳුන්වන්න. (ලකුණු 2)

(ii) දුරස්ථ සංවේද තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කරන වාසර වේදිකා **තුනක්** නම් කරන්න. (ලකුණු 3)

(iii) ගුවන් ඡායාරූප ශිල්පය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 5)

(iv) සංවර්ධනය වෙමින් පවතින රටවල දුරස්ථ සංවේද තාක්ෂණය භාවිත කිරීමේ දී මුහුණ දෙන ගැටළු **තුනක්** නම් කර, ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 5)

(06) භූ ලක්ෂණ සිතියමක ආකෘතියක් පහත දැක්වේ.



(i) මෙම සටහනෙහි A, B, C, D යනුවෙන් දක්වා ඇති කලාප නම් කරන්න. (ලකුණු 2)

(ii) (a) A කලාපයෙහි අන්තර්ගත වන තොරතුරු **දෙකක්** නම් කරන්න. (ලකුණු 2)

(b) B කලාපයෙහි අන්තර්ගත වන තොරතුරු **දෙකක්** නම් කරන්න. (ලකුණු 2)

(iii) (a) භූ ලක්ෂණ සිතියම් සූචකයේ සඳහන් ප්‍රධාන ශීර්ෂ **හතරක්** නම් කරන්න. (ලකුණු 2)

(b) භූ ලක්ෂණ සිතියම් පත්‍රවල දක්නට ලැබෙන දිශා සටහනක් නිවැරදි ව ඇඳ නම් කරන්න. (ලකුණු 3)


(iv) 1:50,000 භූ ලක්ෂණ සිතියමක රේඛීය පරිමාණය නිවැරදි ව ඇඳ දක්වන්න. (ලකුණු 4)

❋ ❋ ❋ ❋

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

12 - භූගෝල විද්‍යාව



පිටපත් අංක 02

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023

Third Term Test - Grade 12 - 2023

භූගෝල විද්‍යාව - II

කාලය පැය 03 යි

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

- එක් කොටසකින් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න.

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

(01) (i) පද්ධතියක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) ශිලාගෝලය තුළ පිහිටි ප්‍රධාන භූ තැටි **හයක්** නම් කරන්න. (ලකුණු 06)

(iii) වායුගෝලය මිනිසාට බලපාන ආකාරය නිදසුන් **තුනක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(v) ජෛවගෝලය කෙරෙහි අහිතකර ලෙස බලපාන මානව ක්‍රියාකාරකම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(02) (i) ලොව භූමිකම්පා ව්‍යාප්ත ව ඇති කලාප ප්‍රධාන කලාප **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) ආක්‍රාන්ත යමකම ආශ්‍රිත භූ රූප **තුනක්** රූප සටහන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) නිෂ්ක්‍රාන්ත යමකම ආශ්‍රිත භූ රූප **තුනක්** රූප සටහන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) භූමිකම්පා හේතුවෙන් සිදුවන හානි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන බලශක්තිමය ඛනිජ වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ලෝහමය නොවන ඛනිජ වර්ග **තුනක** ව්‍යාප්තිය හා භාවිතයන් වෙන වෙනම විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ,

(a) තෙත් කලාපයේ

(b) වියළි කලාපයේ

(c) තෙත් හා වියළි කලාප දෙකෙහි ම

දක්නට ලැබෙන පස් වර්ගය බැගින් නම් කර, ඉන් **එක්** වර්ගයක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

(iv) පාංශු සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) A දකුණු ඇමරිකා මහාද්වීපයේ,

B ඕස්ට්‍රේලියාවේ දක්නට ලැබෙන කාන්තාරය බැගින් නම් කරන්න. (ලකුණු 02)

(ii) සුළං ආශ්‍රිත පරිවහන ක්‍රියාවලිය සිදුවන ආකාරය රූප සටහනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) සුළං ආශ්‍රිත බාදිත භූ රූප **තුනක** නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) කාන්තාර ප්‍රදේශවල ජලයෙන් නිර්මාණය වන භූ රූප **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

(05) (i) ජනාවාසයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)


(ii) ජනාවාස වර්ධන ධූරාවලිය අනුව ග්‍රාමීය ජනාවාස වර්ග නම් කර, ග්‍රාමීය ජනාවාසයක ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06)

(iii) නාගරික ජනාවාස වර්ධන ධූරාවලියේ පහත A, B, C අවස්ථා නම් කර, නාගරික ජනාවාසයක ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)



(iv) ශ්‍රී ලංකාවේ ගැමි නාගරික ජනාවාස ආශ්‍රිත ව හඳුනාගත හැකි ලක්ෂණ **තුනක්** උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) ජන සංඛ්‍යා පිරමීඩයක් යනු කුමක් ද? (ලකුණු 02)



(ii) ඉහත A හා B පිරමීඩ වර්ග **දෙක** නම් කර, ඉන් A රූපයට සමාන ජන සංඛ්‍යා පිරමීඩයක් දක්නට ලැබෙන රටක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) C හා D පිරමීඩ වර්ග **දෙක** නම් කර, ඉන් C රූපයට සමාන ජන සංඛ්‍යා පිරමීඩයක් දක්නට ලැබෙන රටක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) ඉහත D පිරමීඩයක් දක්නට ලැබෙන රටක ජන සංඛ්‍යාව ආශ්‍රිත ව මතුව ඇති ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(07) (i) ඓන්ද්‍රීය කෘෂිකර්මය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) හරිත විප්ලවයෙහි ප්‍රධාන සංරචක **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) හරිත විප්ලවයෙහි අවාසි **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iv) ඓන්ද්‍රීය කෘෂිකර්මයෙහි වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

(08) (i) රටක නාගරීකරණ මට්ටම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

රට	නාගරික ජන සංඛ්‍යා ප්‍රතිශතය %	ග්‍රාමීය ජන සංඛ්‍යා ප්‍රතිශතය %
බ්‍රසීලය	88	12
ආර්ජන්ටිනාව	97	03
කොලොම්බියාව	82	18
ජර්මනිය	78	22
ප්‍රංශය	81	19
එක්සත් රාජධානිය	84	16
නයිජීරියාව	54	46
ඊජිප්තුව	43	57
දකුණු අප්‍රිකාව	68	32

මූලාශ්‍රය : UN Population Division / World Bank urban Population Estimates for 2024

(ii) ඉහත දත්ත අනුව අප්‍රිකානු රටවල නාගරීකරණය සීමිත වීමට බලපා ඇති සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

(iii) දකුණු ඇමෙරිකානු රටවල හා යුරෝපා රටවල නාගරීකරණ මට්ටම ඉහළ අගයක් ගැනීමට බලපෑ හේතු **තුනක්** උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 06)

(iv) නාගරීකරණයේ අහිතකර බලපෑම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

❋ ❋ ❋ ❋

SLGURU.LK
For Educational Purpose Only

“Tell me and I forget. Teach me and I remember. Involve me and I learn.” — Benjamin Franklin



Visit SLGURU.LK to download papers and notes.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2026 - 12 ශ්‍රේණිය

22 භූගෝල විද්‍යාව - I පත්‍රය - පිළිතුරු පත්‍රය

I කොටස

01).	3	11).	2	21).	4	31).	2
02).	5	12).	4	22).	2	32).	4
03).	4	13).	5	23).	3	33).	3
04).	2	14).	3	24).	1	34).	5
05).	1	15).	1	25).	5	35).	1
06).	2	16).	4	26).	4	36).	2
07).	3	17).	3	27).	1	37).	3
08).	1	18).	2	28).	3	38).	4
09).	4	19).	5	29).	2	39).	1
10).	4	20).	1	30).	4	40).	5

ලකුණු 01 බැගින් x 40 - ලකුණු 40

II කොටස

01).

i. ගල / පාෂාණ උද්ගතය **(ලකුණු 01)**

ii. කපොල්ල **(ලකුණු 01)**

iii. පළාත් මායිම **(ලකුණු 01)**

iv. පාසල / උසාවිය /දුම්රිය පොළ **(තුනක් නම් කිරීමට ලකුණු 03)**

v. පොල් වගාව **(ලකුණු 01)**

vi. කොත් කන්ද **(ලකුණු 01)**

vii. කි.මී. 3 (කිලෝමීටර් කණු ඇසුරෙන් පිළිතුර බලාපොරොත්තු වේ) **(ලකුණු 02)**

viii. A ශ්‍රේණියේ මාර්ග / B ශ්‍රේණියේ මාර්ග / සෙසු මාර්ග (අප්‍රධාන මාර්ග) / ජීප් රිය (කරත්ත පාර, ගුරු පාර) / අඩි පාර / පුළුල් ඒකීය දුම්රිය මාර්ගය **(මින් 4කට ලකුණු ½ බැගින් 02)**

ix. - මහා මාර්ග, දුම්රිය මාර්ග, සෙසු මාර්ගවල ව්‍යාප්තිය ආදිය ඇසුරෙන් කරුණු දැක්වීමට ලකුණු ලබා දෙන්න
- ගංගා නිම්න ඔස්සේ මාර්ග ව්‍යාප්තිය (උදා: A1 මාර්ගය)
- කපොලු හරහා දුම්රිය මාර්ග හා මහා මාර්ග ව්‍යාප්ත වී තිබීම
- පහත් බිම්වල මාර්ග සෘජු ව ද, උස් බිම් ආශ්‍රිත ව වංගු ගැසෙමින් ගමන් කිරීම
- උස්බිම් ආශ්‍රිත ව ජීප් රිය මාර්ග හා අඩි පාරවල්


(යනාදි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 04)

x. වී වගාව - පහත් බිම් ආශ්‍රිත ව, ගංගා නිම්න/අතු ගංගා ආශ්‍රිත ව, ඇල මාර්ග දෙපස ව්‍යාප්ත වී තිබීම
පොල් වගාව - පහත් තැනිතලා ආශ්‍රිත ව, සමහර උස් ප්‍රදේශවල
රබර් වගාව - කඳුකර ප්‍රදේශවල
තේ වගාව - මීටර් 100ට වැඩි උස් බිම්වල (ගිනිකොණ කෙළවර ආසන්නයේ උස් බිම්වල)
වෙනත් වැවිලි - මීටර් 100ට වැඩි උස් බිම්වල

(යනාදි වශයෙන් බෝග වර්ග දෙකකවත් ව්‍යාප්තිය විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 04)

SLGURU.LK
For Educational Purpose Only

02). **පිළිතුරු සිතියම**



(ලකුණු 1 බැගින් x 10- ලකුණු 10)

III කොටස

03).

i. පෘථිවියට ඉහළින් කක්ෂගත කර ඇති චන්ද්‍රිකා පද්ධතියක් මගින් පෘථිවියේ ඕනෑම ස්ථානයක කිසියම් වස්තුවක හෝ කිසියම් රූපමිතියක හෝ පිහිටීම ඉතා ම නිවැරදි ව ඛණ්ඩාංකගත ව හඳුනාගැනීම සඳහා නිර්මාණය කොට ඇති යාත්‍රණ පද්ධතිය ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය ලෙස හඳුන්වයි.

(යනාදී නිවැරදි හැඳින්වීමකට - ලකුණු 02)

ii. - ඇසෙන්ෂන් දූපත් - දියාගෝ ගාෂියා දූපත් - ක්වායලෙයින් දූපත් - කොලරාඩෝ ස්ප්‍රින්ග්ස්

(ඇන්ටනා මධ්‍යස්ථාන හතර නිවැරදි ව නම් කිරීමට - ලකුණු 04)

iii. පාලක කොටස (Control Segment)

GPS චන්ද්‍රිකා තොරතුරු ලබාගැනීම හා මෙහෙයවීම ප්‍රධාන පාලක මධ්‍යස්ථානයකින් හා මෙහෙයුම් මධ්‍යස්ථාන හතරකින් ද ග්‍රාහක (Antenna) මධ්‍යස්ථාන කීපයකින් ද සිදු වේ. ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය (Master Control Station) ඇමෙරිකා එක්සත් ජනපදයේ කොලරාඩෝවල පිහිටා ඇත. මෙහෙයුම් මධ්‍යස්ථාන (Monitoring Stations) හවායි දූපත්, ඇසෙන්ෂන්, දියාගෝ ගාෂියා සහ ක්වාලෙයින්. ඇන්ටනා මධ්‍යස්ථාන (Antenna Stations) ඇසෙන්ෂන්, දියාගෝ ගාෂියා, ක්වායලෙයින් සහ කොලරාඩෝ ස්ප්‍රින්ග්ස්.

චන්ද්‍රිකා හා ඒවායේ පාලන කටයුතු සිදු කරන භූමියේ ඇති කොටස පාලක කොටස වේ. මෙමගින් චන්ද්‍රිකා නඩත්තු කිරීම, චන්ද්‍රිකා නියමිත කක්ෂ තලයන් හි පවත්වා ගැනීම, චන්ද්‍රිකා හි ඇති ඔරලෝසු සීරු මාරු කිරීම, යාවත්කාල කල යාත්‍රණ දත්ත උත්පතනය කිරීම, කක්ෂ තල නිසියාකාර ව පවත්වා ගැනීම හා ඒ පිළිබඳ නිරන්තර අවධානයෙන් පසුවීම ආදිය සිදු කරනු ලබයි.

(යනාදී නිවැරදි හැඳින්වීමකට - ලකුණු 04)

iv. - සංඥා බාධා වීම - උස ගොඩනැගිලි, කඳු, ඝන වනාන්තර, සුළං කුණාටු වැනි දේ නිසා GPS සංඥා දුර්වල විය හැක
- නිවැරදිභාවයේ අඩුවීම - ඇතැම් අවස්ථාවල ස්ථානය මීටර් කිහිපයකින් වැරදි ලෙස පෙන්විය හැකි අතර එය ගමන් මාර්ගවල ගැටළු ඇති කිරීම
- බැටරි බලය වැඩිපුර වැය වීම - ජංගම දුරකථන හා GPS උපකරණ දිගු වේලාවක් භාවිත කිරීමෙන් බැටරි ඉක්මනින් බැස යාම
- අන්තර්ජාලය හා තාක්ෂණික උපකරණ මත රඳා පැවතීම - සමහර යෙදුම් නිවැරදිව ක්‍රියා කිරීමට අන්තර්ජාල සම්බන්ධතාව අවශ්‍ය වීම
- පෞද්ගලිකත්ව හා ආරක්ෂක ගැටළු - පුද්ගලයාගේ ස්ථානය නිරීක්ෂණය කළ හැකි බැවින් පෞද්ගලිකත්වයට තර්ජන ඇති වීම
- තාක්ෂණික දෝෂ - චන්ද්‍රිකා දෝෂ, මෘදුකාංග ගැටළු, සිතියම් යාවත්කාලීන නොවීම වැනි දේ නිසා වැරදි තොරතුරු ලැබීම
- කාලගුණ බලපෑම් - අධික වැසි, ගිගුරුම් සහිත කාලගුණය හෝ සූර්ය කුණාටු GPS සංඥා වලට බාධා කළ හැක
- අධික විශ්වාසය - GPS මත පමණක් රඳා පැවතීම නිසා සාම්ප්‍රදායික සිතියම් කියවීමේ හැකියාව අඩුවිය හැක
- හමුදා හෝ ආරක්ෂක සීමා - ඇතැම් ප්‍රදේශවල GPS සංඥා හිතාමතාම සීමා කිරීම හෝ අවහිර කිරීම සිදු කළ හැක
- පිරිවැය - උසස් GPS උපකරණ හා යාවත්කාලීන සිතියම් ලබාගැනීමට වියදම් අවශ්‍ය විය හැක

(යනාදී ගැටළු තුනක් සඳහන් කිරීමට ලකුණු 03 + එකක් විස්තර කිරීමට ලකුණු 02 - ලකුණු 05)

SLGURU.LK
For Educational Purpose Only

04)


i. පරිගණක දෘඩාංග හා මෘදුකාංග භාවිත කරමින් භූ අවකාශීය තොරතුරු ඇතුළත් කිරීම, ගබඩා කිරීම, අවශ්‍ය පරිදි සකස් කිරීම හා නිරූපණය කිරීම සඳහා භාවිත කරන ක්‍රමවේදයක් ලෙස භූගෝලීය තොරතුරු පද්ධතිය හැඳින්විය හැකි ය.

(යනාදි නිවැරදි හැඳින්වීමකට - ලකුණු 02)

ii. a. - දෛශික දත්ත ආකෘතිය (Vector Data Model)
- සිව්රැස් දත්ත ආකෘතිය (Raster Data Model) **(ආකෘති දෙක නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 01)**

b. - දෛශික දත්ත ආකෘතිය (Vector Data Model)


ඕනෑම රූපමිතියක් නිවැරදි ව අංකනය කළ හැකි මාධ්‍යයකි. බණ්ඩාංක මත පදනම් ව ඇත. තොරතුරු ගබඩා කිරීම ද බණ්ඩාංක මත පදනම් ව සිදුවේ. සියලු ම භූගෝලීය ලක්ෂණ, ලක්ෂ්‍ය (Points) රේඛා (Lines) හා කලාප නැති නම් බහු-අස්‍රවලින් (Polygons) යන මූලික සංකේතවලින් නිරූපණය කරයි.



- සිව්රැස් දත්ත ආකෘතිය (Raster Data Model)

යථා ලෝකයේ පවතින සංකීර්ණ අවකාශීය රටා පරිගණක ගත කිරීමට යොදා ගනී. අදාළ ප්‍රදේශය තීර (Rows) හා පේළි (Column) ඇසුරින් කොටු (Cell) රටාවකට පරිවර්තනය කරයි. සෑම කොටුවක් ම (Pixel) නිරීක්ෂණ ඒකකයක් ලෙස සලකයි. විවිධ සංඛ්‍යාත්මක වටිනාකම් සහිත පික්සල් වලින් දක්වයි. සෑම පික්සලයක් මගින් ම පිහිටීම මෙන්ම අදාළ වටිනාකම් ද නිරූපණය කරයි.

මෙම ක්‍රමයේ දී සිතියම් ප්‍රදේශය තීරු (Columns) හා පේළි (Rows) රටාවකට පරිවර්තනය කොට සෑම කොටසක් ම (Pixel) නිරීක්ෂණ ඒකක වශයෙන් සලකා ඒවාට යම් සංඛ්‍යාත්මක වටිනාකම් ලබාදීම සිදු කරයි.



(එකක් විස්තර කිරීමට ලකුණු 03)

iii. **- ප්‍රතිදාන උපාංග**
- සන්දර්ශකය
- මුද්‍රණ යන්ත්‍රය

- මෘදුකාංග

- Mapinfo	- Arc view GIS	- Arc GIS
- Intergraph	- Global Mapper	- GRASS
- SAGA GIS	- ILWIS	- IDRISI

(ප්‍රතිදාන උපාංග දෙක නම් කිරීමට ලකුණු 02 + මෘදුකාංග දෙකක් නම් කිරීමට ලකුණු 02 - ලකුණු 04)

iv. - ඉතා නිවැරදි සිතියම් සකස් කළ හැකි වීම
- වේගයෙන් සිතියම් නිර්මාණය කළ හැකි වීම
- දත්ත යාවත්කාලීන කිරීම පහසුය
- විශාල ප්‍රමාණයේ දත්ත පද්ධතිමය ලෙස කළමනාකරණය කළ හැකි වීම
- බහු තට්ටු දත්ත (layers) එකට එකතු කර පෙන්විය හැකි වීම
- විවිධ ආකාරයේ සිතියම් (භූ ලක්ෂණ, ජනගහණ, වාෂ්පීභවය ආදිය) නිර්මාණය කළ හැකි වීම
- දත්ත විශ්ලේෂණය කර තීරණ ගැනීම සඳහා උපකාරී වේ
- සිතියම් මගින් තොරතුරු දෘශ්‍යමය ලෙස ඉදිරිපත් කළ හැකි වීම
- දත්ත අතර සම්බන්ධතා හඳුනාගැනීමට පහසු ය
- ආරක්ෂිතව දත්ත ගබඩා කිරීම හා බෙදාගැනීම කළ හැකි වීම
- දෘශ්‍යමය ගුණාංග හා නිර්මාණය ආකර්ෂණීය ලෙස පෙන්විය හැකි වීම
- වෙනත් තාක්ෂණයන් (GPS, Remote Sensing) සමඟ ඒකාබද්ධ කළ හැකි වීම

(යනාදි වාසි තුනක් නම් කිරීමට ලකුණු 3 + ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 02 - ලකුණු 05)

SLGURU.LK
For Educational Purpose Only

05)

i. යම්කිසි වස්තුවක් හෝ ක්‍රියාකාරිත්වයක් හෝ වෙත භෞතික ව ළඟා නොවී දුර සිට හඳුනා ගැනීම, අධ්‍යයනය කිරීම, වටහා ගැනීම හා විශ්ලේෂණය කිරීමේ තාක්ෂණය දුරස්ථ සංවේදය යි.

(යනාදි නිවැරදි හැඳින්වීමකට - ලකුණු 02)

ii.
- ගුවන් යානා
- මිනිසුන් රහිත ගුවන් යානා (UAV)
- අහස් නැව් (Pirigibles)
- කුඩා අහස් නැව් (Blimps)
- හෙලිකොප්ටර්
- ඩ්‍රෝන යානා (Drones)
- බැලූන් (Balloons)


(වේදිකා තුනක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 03)

iii. ගුවන් ඡායාරූප ශිල්පය

ගුවන් ඡායාරූපයක් යනු ගුවනේ සිට නිශ්චිත පියාසර සැලසුමකට අනුව නිශ්චිත පරිමාණයකින් යුක්ත ව භූමියෙහි කිසියම් තෝරාගත් කොටසක් ආවරණය වන ආකාරයට ලබාගන්නා ඡායාරූපයකි. ගුවන් ඡායාරූප ලබාගන්නා කෝණය අනුව (Angle) වර්ග කළ හැකි ය.


- සිරස් ගුවන් ඡායාරූප (Vertical Aerial Photography)

සිරස් ගුවන් ඡායාරූප ලබා ගැනීමේ දී කැමරාවේ ප්‍රකාශන අක්ෂය (Optical Axis) පොළොවට ලම්බාකාර ව තබා ගැනීම සිදු කරයි.



- ඇල ගුවන් ඡායාරූප (Oblique Aerial Photography)

ඇල ගුවන් ඡායාරූප ලබා ගැනීමේ දී කැමරාවේ ප්‍රකාශන අක්ෂය පොළොවට ලම්බාකාර ව නොපිහිටයි. එමඟින් ගනු ලබන ඡායාරූපවල ත්‍රිමාණ ලක්ෂණ පැහැදිලි ව දැකිය හැකි ය.



(යනාදි නිවැරදි හැඳින්වීමකට - ලකුණු 05)

iv. - පිරිවැය අධික වීම - චන්ද්‍රිකා දත්ත, මෘදුකාංග, උපකරණ හා පරිගණක පද්ධති මිල අධික වීම
- තාක්ෂණික දැනුම හිඟය - දුරස්ථ සංවේද දත්ත විශ්ලේෂණයට අවශ්‍ය පුහුණු නිලධාරීන් හා විශේෂඥයින් ප්‍රමාණවත් නොවීම
- නවීන උපකරණ හිඟය - උසස් ගුණාත්මක කැමරා, සංවේද හා පරිගණක පහසුකම් නොමැති වීම
- අන්තර්ජාල හා තොරතුරු තාක්ෂණ පහසුකම් දුර්වල වීම - විශාල දත්ත ගොනු බාගත කිරීම හා සැකසීම සඳහා වේගවත් අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වේ
- චන්ද්‍රිකා දත්ත ලබාගැනීමේ අපහසුතා - සමහර දත්ත සඳහා මුදල් ගෙවිය යුතු වීම හෝ යාවත්කාලීන දත්ත නොලැබීම
- බලශක්ති ගැටළු - විදුලි බල සැපයුම අස්ථාවර වීම නිසා දත්ත සැකසීම හා පද්ධති ක්‍රියාකාරිත්වය බාධා වීම
- කාලගුණ බලපෑම් - වලාකුළු ආවරණය, වැසි හා කුණාටු නිසා චන්ද්‍රිකා ඡායාරූප පැහැදිලි නොවීම
- දත්ත සැකසීමේ සංකීර්ණතාව - ලැබෙන දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම සංකීර්ණ වීම
- පර්යේෂණ හා ආයෝජන අඩුවීම - රජයේ හා පෞද්ගලික අංශයේ ප්‍රමාණවත් ආයෝජන නොමැති වීම
- නීතිමය හා ආරක්ෂක සීමා - ඇතැම් භූගෝලීය දත්ත ජාතික ආරක්ෂාව හේතුවෙන් සීමා කිරීම
- භාෂා හා අධ්‍යාපන ගැටළු - බොහෝ මෘදුකාංග හා තාක්ෂණික දැනුම ඉංග්‍රීසි භාෂාව මත පදනම් වීම
- දත්ත යාවත්කාලීන නොවීම - පැරණි දත්ත භාවිත කිරීම නිසා තීරණ ගැනීමේදී දෝෂ ඇති විය හැක

(යනාදි ගැටළු තුනක් සඳහන් කිරීමට ලකුණු 03 + එකක් විස්තර කිරීමට ලකුණු 02 - ලකුණු 05)

SLGURU.LK
For Educational Purpose Only


06) i. **A** - ඉහළ වට තීරුව / වට තීරුවේ ඉහළ කොටස
B - ඇතුළු මායිම් තීරුව
C - පහළ වට තීරුව / වට තීරුවේ පහළ කොටස
D - සිතියම් මුහුණත **(නිවැරදි ව නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 02)**

ii. a. සිතියම් වර්ගය / සිතියමේ නම / සිතියම් අංකය **(මින් දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 02)**
b. මාර්ග ගමනාන්ත / ජාතික බණ්ඩාංක / ගෝලීය බණ්ඩාංක (විශ්වීය බණ්ඩාංක/අක්ෂාංශ හා දේශාංශ)
(මින් දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 02)

iii. a.
- මායිම්
- මංමාවත්
- වෘක්ෂලතා
- භූවිෂමතාව
- සංචාරක තොරතුරු
- දුම්රිය මාර්ග
- ජලවහනය
- වෙනත් ලක්ෂණ


(මින් 04 ක් නිවැරදි දැක්වීමට ලකුණු ½ බැගින් - ලකුණු 02)

b.



(මින් එකක් නිවැරදි ව ඇඳ නම් කිරීමට ලකුණු 03)

iv.



(රේඛාව ඇඳ නිවැරදි ව කොටස් වලට බෙදීමට - ලකුණු 01
නම් කිරීමට - ලකුණු 01
පළමු උප කොටස අනු කොටස්වලට බෙදා දැක්වීමට - ලකුණු 01
පරිමාණය සඳහන් කිරීමට - ලකුණු 01
- ලකුණු 04)

✵✵✵✵

SLGURU.LK
For Educational Purpose Only

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2026

22 භූගෝල විද්‍යාව - II පත්‍රය - පිළිතුරු

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01). පද්ධතියක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

i. පද්ධතියක් යනු සංරචක (Components) රාශියක් එකිනෙකට සම්බන්ධතාවෙන් යුතු ව නිශ්චිත සීමාවක් තුළ ක්‍රියාත්මක වන ව්‍යූහයකි. පද්ධතියක් ලෙස හැඳින්වෙන්නේ කිසියම් ව්‍යූහයකට අනුව සකස් වූ එකිනෙක හා බැඳී පවතින වස්තු හෝ ද්‍රව්‍ය හෝ සමූහයක එකතුවකි. අප ජීවත් වන පෘථිවිය ද ඉතා විශාල පද්ධතියකි.

(යනාදි නිවැරදි හැඳින්වීමක් සඳහා - ලකුණු 02)

ii. ශිලාගෝලය තුළ පිහිටි ප්‍රධාන භූ තැටි හයක් නම් කරන්න.

- පැසිෆික්
- අප්‍රිකානු
- උතුරු ඇමරිකා
- දකුණු ඇමරිකා
- යුරේසියන්
- ඉන්දු-ඕස්ට්‍රේලියන්
- ඇන්ටාක්ටික්

(නිවැරදි ව හයක් නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 06)

iii. වායුගෝලය මිනිසාට බලපාන ආකාරය නිදසුන් තුනක් ඇසුරින් විස්තර කරන්න.

- හුස්ම ගැනීමට අවශ්‍ය ඔක්සිජන් ලබා දීම
- සූර්යයාගේ අහිතකර (UV) විකිරණවලින් ආරක්ෂා කිරීම
- පෘථිවියේ උෂ්ණත්වය සමතුලිත ව පවත්වා ගැනීම
- වැසි, සුළං, වලාකුළු වැනි කාලගුණ තත්ත්ව ඇති කිරීම
- ජල චක්‍රය ක්‍රියාත්මක කිරීම
- ශබ්දය ගමන් කිරීමට මාධ්‍යයක් සැපයීම
- ගුවන් යානා ගමනාගමනයට උපකාරී වීම
- ශාක වර්ධනය සඳහා කාබන් ඩයොක්සයිඩ් ලබා දීම
- මිනිසාගේ සෞඛ්‍යයට සහ ජීවන රටාවට බලපෑම් කිරීම
- සන්නිවේදන තරංග (Radio Waves) පරාවර්තනයට සහාය වීම

(යනාදි බලපෑම් තුනක් නිදසුන් සහිත ව විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iv. ජෛවගෝලය කෙරෙහි අහිතකර ලෙස බලපාන මානව ක්‍රියාකාරකම් තුනක් පැහැදිලි කරන්න.

- වනාන්තර විනාශ කිරීම
- කර්මාන්තශාලා මඟින් පරිසර දූෂණය
- වාහන වලින් වායු දූෂණය
- ජල මූලාශ්‍ර දූෂණය කිරීම
- අධික රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය
- අධික ලෙස සත්ත්ව හා ශාක සම්පත් භාවිතා කිරීම
- අවිධිමත් කසළ බැහැර කිරීම
- ගිනි තැබීම් හා කැලෑ ගිනි ඇති කිරීම
- ගල්, වැලි හා අනෙකුත් ඛනිජ අධික ලෙස කැණීම
- නාගරීකරණය හා කාර්මීකරණය වැඩි වීම
- අධික ලෙස මසුන් අල්ලීම
- ශබ්ද දූෂණය හා විකිරණ (තාප) දූෂණය
- ගෝලීය උෂ්ණත්වය වැඩි කරන විවිධ වූ ක්‍රියාකාරකම්
- දුම්වැටි හා විෂ වායු පරිසරයට මුදා හැරීම
- වනජීවීන් හා වනජීවී වාසස්ථාන විනාශ කිරීම

(යනාදි ක්‍රියාකාරකම් තුනක් විස්තර පැහැදිලි කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

02).


i. ලොව භූමිකම්පා ව්‍යාප්ත ව ඇති කලාප ප්‍රධාන කලාප දෙකක් නම් කරන්න.

- පරි-පැසිපික් කලාපය
- මධ්‍යධරණී-හිමාලය කලාපය
- මධ්‍ය අත්ලාන්තික් සාගරික වැටි කලාපය
- අප්‍රිකානු සුවිභේද නිම්න කලාපය

(මින් දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 02)

ii. ආක්‍රාන්ත යමකම ආශ්‍රිත භූ රූප තුනක් රූප සටහන් ඇසුරින් විස්තර කරන්න.


- ඩයික
- ආස්තර
- ලැකොලිත
- ලොපොලිත
- පාකොලිත
- බැතොලිත



(ආක්‍රාන්ත යමහල් භූ රූප තුනක් රූපසටහන් ඇසුරින් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iii. නිෂ්ක්‍රාන්ත යමකම ආශ්‍රිත භූ රූප තුනක් රූප සටහන් ඇසුරින් විස්තර කරන්න.

- යමහල් කේතු
- යමහල් අළු කේතු
- සංයුක්ත කේතු
- කල්දේරාව
- ලාවා සානු
- ලාවා පේනු



(නිෂ්ක්‍රාන්ත යමහල් භූ රූප තුනක් රූප සටහන් ඇසුරෙන් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iv. භූමිකම්පා හේතුවෙන් සිදුවන හානි තුනක් විස්තර කරන්න.

- සුනාමි තත්ත්ව ඇති වීම
- නාය යෑම් සිදු වීම
- හිමකඳු කඩා වැටීම්
- කබොල බිඳීම
- ජල සම්පත්වල ස්වරූපය විකෘති වීම/වෙනස් වීම
- භූ කම්පන තරංග පොළොව මට්ටම කරා ගමන් කිරීමේ දී තරංග පැතිරෙන කලාපය දෙදරා යෑමෙන් පෘථිවි අභ්‍යන්තරයේ ස්තර මෙන් ම මතුපිට භෞතික වස්තු ද හානියට පත් වීම
- ජීවිත හානි සිදු වීම
- දේපළ හානි සිදු වීම
- යටිතල පහසුකම් විනාශ වීම

(යනාදී හානි තුනක් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

03).

i. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන බලශක්තිමය ඛනිජ වර්ග දෙකක් නම් කරන්න.

- පීට්/ජීර්ණක
- තෝරියනයිට්
- මොනසයිට්

(මින් දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ලෝහමය නොවන ඛනිජ වර්ග තුනක ව්‍යාප්තිය හා භාවිතයන් වෙන වෙනම විස්තර කරන්න.

ලෝහමය නොවන ඛනිජය	ව්‍යාප්තිය	භාවිතයන්
මැටි	දෙදියවල, මීටියාගොඩ, නාත්තන්ඩිය, රත්තොට, වස්කඩුව, බොරලැස්ගමුව වැනි ප්‍රදේශවල	ටයිල්, ගඩොල්, පෝසිලේන් භාණ්ඩ, විසිතුරු භාණ්ඩ, සනීපාරක්ෂක කට්ටල, තීන්ත වර්ග, කඩදාසි, රබර් නිෂ්පාදන, දත් බෙහෙත්, සිමෙන්ති කර්මාන්ත ආදිය
ධමනි/කුට්ටි මිනිරන්	බෝගල, කහටගහ, රාගෙදර, කොලොන්ගහ, රංගල, සියඹලාපිටිය, බෝතලේ	පැන්සල් කුරු, අච්චු (කෝව), බැටරි, පුපුරණ ද්‍රව්‍ය, තීන්ත, ලිහිසි තෙල්, ඉලෙක්ට්‍රෝඩ, පරාවර්තක, තිරිංග ලයිනින් ආදිය
මයිකා/තලාතු මිනිරන්	තලාගොඩ, මඩුමාන, පල්ලෙකැලේ, තලාතුඔය, මයිලපිටිය, පින්නවල, දුටුවැව, ගොඩකවෙල බදුල්ල, මාතලේ, නුවරඑළිය, මොනරාගල වැනි ප්‍රදේශවල	තීන්ත, වාර්නිෂ්, රූපලාවන්‍ය ද්‍රව්‍ය, බොයිලේරු ආවරණ, ප්ලාස්ටික් හා රබර් පිරවුම්, විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්ත ආදිය
මැණික්	රත්නපුර, බලංගොඩ, ඇහැලියගොඩ, ඔක්කම්පිටිය, ඇලැහැර, අවිස්සාවේල්ල වැනි ප්‍රදේශවල	ආභරණ, ඔරලෝසු බෙයාරිං, විසිතුරු භාණ්ඩ, අපනයන හා විදේශ විනිමය ඉපැයීම් ආදිය
ඛනිජ වැලි	පුල්මුඩේ, කුදිරමලේ, කයිකාවල, නිලාවැලි, ගංගා නිම්න ආශ්‍රිත ව, ශ්‍රී ලංකාව වටා වෙරළ තීරය පුරා, මාරවිල, හලාවත, නාත්තන්ඩිය, මාදම්පේ, අම්පාර, වල්ලිපුරම්, බලංගොඩ, මීරිගම	ටයිටේනියම්, රූපවාහිනී තිර, පිඟන් හා වීදුරු නිපදවීම, විද්‍යුත් උපකරණ නිපදවීම, අපනයන කිරීම, ආලේපන ලෙස භාවිත කිරීම, වාත්තු අච්චු, වීදුරු තහඩු නිපදවීම

- **මීට අමතරව වැලි, ලුණු, ඩොලමයිට්, ඇපටයිට්, ෆෙල්ඩ්ස්පාර්, බොරළු යනාදී ලෝහමය නොවන ඛනිජ වර්ග පිළිබඳව නිවැරදි ව්‍යාප්තීන් හා ප්‍රයෝජන දැක්වීමට ලකුණු ලබා දෙන්න.**

(ඛනිජ වර්ගයක ව්‍යාප්තිය දැක්වීමට ලකුණු 01
භාවිතයන් විස්තර කිරීමට ලකුණු 01
ඛනිජ වර්ග තුනක් සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iii. ශ්‍රී ලංකාවේ a. තෙත් කලාපයේ, b. වියළි කලාපයේ, c. තෙත් හා වියළි කලාප දෙකෙහිම දක්නට ලැබෙන පස් වර්ගය බැගින් නම් කර, ඉන් එක් වර්ගයක් පිළිබඳ විස්තර කරන්න.

a තෙත් කලාපයට සීමා වූ පස් වර්ග

- රතු දුඹුරු ලැටසොල්ස් පස
- රතු කහ පොඩ්සොලික් පස
- ගොහොරු හා අර්ධ ගොහොරු පස

b වියළි කලාපයට සීමා වූ පස් වර්ග

- රතු දුඹුරු පස
- ක්ෂාරීය නොවන දුඹුරු පස
- රතු කහ ලැටොසොල්ස් පස
- ග්‍රැමුසොල්ස් පස
- ක්ෂාරීය සහ ලවණ පස

c වියළි සහ තෙත් යන කලාප දෙකේ ම ඇති පස් වර්ග

- දුර්වල ජලවහනයක් පවතින හියුමික් පස්
- දියළු පස
- රෙගොසොල්ස් පස

SLGURU.LK
For Educational Purpose Only

රතු දුඹුරු ලැටසොල් පස

මනා ජලවහනයකින් යුක්ත ය. සියුම් වයනයකින් යුක්ත අතර රතු දුඹුරු වර්ණය වේ. නයිට්‍රජන්, පොටෑසියම්, කැල්සියම් හා මැග්නීසියම් මධ්‍යස්ථ ප්‍රමාණයකින් යුක්ත මෙම පස සශ්‍රීකත්වයෙන් ඉහළ යි. කඳු සහ රැලි භූ දර්ශනය සහිත ප්‍රදේශවලත් නිම්න භූ දර්ශනය සහිත ප්‍රදේශවලත් බහුල ව දක්නට ලැබේ. මහනුවර, කෑගල්ල දිස්ත්‍රික්කවල වැඩි ප්‍රදේශයක ද මාතලේ දිස්ත්‍රික්කයේ නිරිත දිශානුගත ව ද ව්‍යාප්ත ව ඇත.

රතු දුඹුරු පස

සාමාන්‍ය ගැඹුරකින් හා මනා ජලවහනයකින් යුක්ත ය. තද දුඹුරු පැහැති මෙම පසෙහි A මහල සෙ.මී. 13 - 25 නත්වයකින් හා මධ්‍යස්ථ සියුම් වයනයකින් යුක්ත වේ. ප්‍රධාන වශයෙන් තිරුවාණා, බොරලු හෝ යගල් අඩංගු වේ. ඓන්ද්‍රීය ද්‍රව්‍යවල කැල්සියම් සහ මැග්නීසියම් අඩංගු වන අතර නයිට්‍රජන් ප්‍රමාණය අඩු ය. මෙම පස වියළි කලාපයට අයත් අනුරාධපුර, පොළොන්නරුව, වව්නියාව, හම්බන්තොට, මොනරාගල හා යාබද දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශවල ව්‍යාප්ත ව පවතී. ධාන්‍ය වර්ග මුං, මෑ වැනි ඇට වර්ග, තෙල් ඇට හා වෙනත් අතිරේක ආහාර බෝග වගා සඳහා යෝග්‍ය වේ.

දියළු පස

ජලය මඟින් නිර්මාණය වූ නිධිසාදිත පසකි. මනා ජලවහන තත්ත්වයේ සිට දුර්වල ජලවහනය තෙක් වෙනස් වේ. පසේ වයනය වැලිමය මැටි ස්වභාවයක් ගනී. ගංගා ආශ්‍රිත භූමිවල ද පිටාර තැනිවල ද ව්‍යාප්ත ව පවතී. වී වගාව සඳහා ඉතා යෝග්‍ය මෙම පස එළවුළු වගාව සඳහා ද යොදාගත හැකි ය.

(එක් කලාපයක එක් පස් වර්ගය බැගින් නම් කිරීමට ලකුණු 1 බැගින් ලකුණ 03 +
ඉන් එක් වර්ගයක් පැහැදිලි කිරීම සඳහා ලකුණු 03
ලකුණු 06)

iv. පාංශු සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න.

- වනාන්තර ආරක්ෂා කිරීම හා නැවත වගා කිරීම
- කඳු බෑවුම්වල හෙල්මළු වගාව කිරීම
- සමෝච්ඡ රේඛා අනුව වගා කිරීම
- ආවරණ බෝග වගා කිරීම
- අධික ලෙස වනාන්තර කැපීම වැළැක්වීම
- සුළං බාධක ලෙස ගස් වගා කිරීම
- අධික ලෙස තෘණ උලා කෑම පාලනය කිරීම
- ජලය නිසි ලෙස කළමනාකරණය කිරීම
- කාබනික පොහොර භාවිතය වැඩි කිරීම
- රසායනික පොහොර හා කෘමිනාශක අධික භාවිතය අවම කිරීම
- ගල්වැටි හා ජලාපවහන මාර්ග නිසි ලෙස සැකසීම
- පස් කැණීම් හා වැලි ගැරීම පාලනය කිරීම
- කෘෂිකාර්මික භූමි නිසි ලෙස භාවිතා කිරීම
- ඛාදනය වැළැක්වීමට තණකොළ වගා කිරීම
- පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීම

(යනාදි ක්‍රියාමාර්ග තුනක් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

04).


i. A. දකුණු ඇමරිකා මහාද්වීපයේ, B. ඕස්ට්‍රේලියාවේ දක්නට ලැබෙන කාන්තාරය බැගින් නම් කරන්න.

A - අටකාමා / පැටගෝනියා

B - මහා වාලුකා / සිම්සන් / වික්ටෝරියා /ගිබ්සන් / ටනාමි

(කාන්තාරය බැගින් නම් කිරීමට ලකුණු 01 බැගින් - ලකුණු 2)

ii. සුළං ආශ්‍රිත පරිවහන ක්‍රියාවලිය සිදුවන ආකාරය රූපසටහනක් ඇසුරින් විස්තර කරන්න.



ශුෂ්ක ප්‍රදේශවල බාදනය වූ විශාල, කුඩා පාෂාණ කොටස් හා දූවිලි අංශු ක්‍රම තුනකට පරිවහනය කෙරේ.


- අවලම්බනය
- පිනුම් ගමන
- පෙරළි ගමන

- කාන්තාරවල සියුම් වැලි දූවිලි අංශු සුළඟ මඟින් ඉහළින් ම ඔසවාගෙන යෑම අවලම්බනය යි. ඒවා රැගෙන යන දුර තීරණය වන්නේ සුළඟේ වේගය හා භාරයේ ස්වරූපය හා බර අනුව යි. සුළං ප්‍රවාහ මඟින් මේවා ප්‍රභව ස්ථානයේ සිට කිලෝ මීටර් සිය ගණනක් ඈතට පරිවහනය කෙරේ.
- පිනුම් ගමන යනු තරමක් බරින් යුතු ගල්කැට, වැලිකැට ආදිය සුළඟ සමඟ ඉදිරියට පනිමින් ගමන් කිරීම යි.
- පෙරළි ගමන යනු තරමක් බරින් වැඩි ද්‍රව්‍ය පෙරළමින්, තල්ලු වෙමින් භූ තලය දිගේ ඉදිරියට ගමන් කිරීම යි.

(නිවැරදි විස්තරයකට හා රූප සටහනට ලකුණු 06)

iii. සුළං ආශ්‍රිත බාදිත භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය විස්තර කරන්න.

- අපහරණ ද්‍රෝණි
- වාමට කැට
- යාඩැම
- සොයිගම
- ඉන්සෙල්බර්ග්
- ගවුර්
- මේසාව හා බියුට



(භූ රූප තුනක් රූප සටහන් ඇසුරෙන් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iv. කාන්තාර ප්‍රදේශවල ජලයෙන් නිර්මාණය වන භූ රූප තුනක් විස්තර කරන්න.

- දියළු අවාන් / ගිරි පාද ගැටි

වර්ෂාපතන සෘතුවේ දී ඇතිවන ක්ෂණික ගංවතුර හේතුවෙන් නිර්මාණය වේ. විශාල පුනීලයක හැඩය ඇති ද්‍රෝණියකින් දියළු අවාන් නිර්මාණය වේ. ඉතා පටු ජල දහරාවක් දිගේ ශුෂ්ක ප්‍රදේශවලින් රැගෙන එන භාරය අවානක ස්වරූපයෙන් තැන්පත් වේ. මෙම භාරය සාරවත් දියළු හා ජලයෙන් යුක්ත ය.

- වාඩි / මළ දොළ / ඇඟිලි / කඳුරු

විවිධ නම්වලින් හැඳින්වෙන මේවා ගංගාවක් රහිත කුඩා බිම් නිම්නයක, අධික වර්ෂාපතනය ලැබෙන විට පමණක් නිර්මාණය වේ. ඉවුරු ඉතා දළ බෑවුම් සහිත ව කඩතොළු ස්වරූපයෙන් පවතී. වර්ෂාපතන සෘතුවේ දී මෙම වාඩි බාදනයට ලක් වේ.

- ප්ලායා විල් / ලවණ විල්

ශුෂ්ක ප්‍රදේශවල මුහුදු මට්ටමට වඩා පහළින් නිර්මාණය වේ. වියළි කාලයේ දී මෙම විල් තද සහ රළු මතුපිටකින් යුක්ත වේ. වර්ෂාපතන සෘතුවල දී තෙත් බවට පත් වීමෙන් විල් මතුපිට මෘදු වේ. ජලය වාෂ්පීකරණය වීමෙන් ලුණු/ලවණ මතුපිට ඉතිරි වේ.

- බහාඩා

දියළු අවාන් රාශියක් එකට එකතු වීමෙන් බහාඩා නිර්මාණය වේ. දියළු අවාන්වලින් රැගෙන එන ජලය සමස්ත බහාඩාව පුරා ම සමාන ලෙස පැතිරීමක් දක්නට ලැබේ.

- සල පිල / වියළි නිම්න

ශුෂ්ක ප්‍රදේශවල කඳු වැටියක් පාමුල සල පිල නිර්මාණය වේ. ජීර්ණාවශේෂවලින් වැසුණු මඩ සහිත පාෂාණ තලාවක් ලෙස හැඳින්විය හැකිය. මෙය උත්තල ස්වරූපයකින් යුක්ත ය.

- පරජනිත ගංගාව

වෙනත් ප්‍රදේශයකින් ආරම්භ වී, විශාල ජල ධාරාවක් සහිත ව කාන්තාර ප්‍රදේශ හරහා ගලා බසිනා ගංගාවන් පරජනිත ගංගා ලෙස හැඳින්වේ.

උදා: අප්‍රිකාවේ නයිල් ගඟ, ආසියාවේ යුප්‍රටීස්-ටයිග්‍රීස්, උතුරු ඇමරිකාවේ කොළරාඩෝ

(භූ රූප තුනක් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් (රූපසටහන් අත්‍යවශ්‍ය නැත) - ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05).

i. ජනාවාසයක් යනු කුමක් දැයි හඳුන්වන්න.

- ජනාවාස යනු පොළොතලයේ මිනිසා විසින් ගොඩනඟන ලද වාසභූමියක්
- නිවාස, ගොඩනැඟිලි පමණක් නොව වැටවල්, මාර්ග, ගබඩා, ගොවිපළවල් ආදි සියල්ලක් ම ඇතුළත් ව, මිනිසා විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියලු දෙයින් ද විවිධත්වයක් ඇති පුද්ගලයන් සමූහයකින් ද සමන්විත වූවකි.

(යනාදී නිවැරදි හැඳින්වීමකට - ලකුණු 02)

ii. ජනාවාස වර්ධන ධූරාවලිය අනුව ග්‍රාමීය ජනාවාස වර්ග නම් කර, ග්‍රාමීය ජනාවාසයක ලක්ෂණ විස්තර කරන්න.

- හුදෙකලා ගෙය හෝ ගොවිපල
- කුඩා ගම
- ගම

ග්‍රාමීය ජනාවාසයක ලක්ෂණ

ප්‍රාථමික ආර්ථික කටයුතු කේන්ද්‍ර කරගෙන මෙම ජනාවාස බිහි වේ. ගොවිතැන, ධීවර කර්මාන්තය, සත්ත්ව පාලනය, දඩයම් කිරීම මෙම ප්‍රාථමික ආර්ථික කටයුතු වේ. මාර්ග ජාලය අක්‍රමවත් ය. නොදියුණු ය. බටහිර රටවල ග්‍රාමීය ජනාවාස ඉතා පහසුවෙන් හඳුනාගත හැකි ය. ඒවායේ නිවාස අතර පරතරය වැඩි ය. ජන ඝනත්වය අඩු ය. එහෙත් සංවර්ධනය වන රටවල ග්‍රාමීය ජනාවාසවල නිවාස පිහිටා ඇත්තේ විවිධ ආකාරයට ය. බොහෝ විට ග්‍රාමීය ජනාවාසවල ගොවිබිම් හා ගොඩනැඟිලි ඉදි කළ බිම් පැහැදිලි ව හඳුනා ගැනීමට පුළුවන. ග්‍රාමීය ජනාවාසවල තාවකාලික හා ස්ථිර ජනාවාස දක්නට ඇත. විශේෂයෙන් ම ආර්ථික කටයුතු හා සම්බන්ධ වූ තාවකාලික, අර්ධ ස්ථාවර ජනාවාස ද ග්‍රාමීය ප්‍රදේශවල ඇත. ආහාර සොයා කාලීන ව සංක්‍රමණය වීම, සංචාරක ධීවර කර්මාන්තය, සල ගොවිතැන, ඍතුමය දේශගුණික වෙනස්වීම් ආදි දුෂ්කරතා වැනි දේ නිසා තාවකාලික හා ස්ථාවර ජනාවාස ඇති වේ.

(ග්‍රාමීය ජනාවාස වර්ග තුන නම් කිරීමට ලකුණු 03 + ග්‍රාමීය ජනාවාසයක ලක්ෂණ විස්තර කිරීම සඳහා ලකුණු 03 ලකුණු 06)

iii. නාගරික ජනාවාස වර්ධන ධූරාවලියේ පහත A, B, C **අවස්ථා නම් කර, නාගරික ජනාවාසයක ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.**

A - මහ නගරය
B - නාගරික සමූහිතය
C - නගර යාය



නාගරික ජනාවාසයක ලක්ෂණ

සීමිත බිම් ප්‍රමාණයක අධික ජන පිරිසක් වාසය කරති. අධික ජනඝනත්වයකින් යුතු කාර්මික පරිපාලන, වාණිජ, අධ්‍යාපනය වැනි කාර්ය ඒකරාශි වී ඇති ජනාවාස නාගරික ජනාවාස වේ. නගරයක ඉදි කළ ප්‍රදේශය තුළ මෙම විවිධ කාර්ය ඒකරාශි වී තිබේ. ලෝකයේ නාගරික ජනාවාස වර්ධනයේ ශීඝ්‍ර ඉහළයාම වර්තමානයේ දැකිය හැකි ලක්ෂණයකි. ඉහළ මෙන් ම පහළ තනතුරුවල රැකියා කරන්නෝ නගරවලට සංක්‍රමණය වෙති. මුඩුක්කු, පැල්පත්, අඩු පහසුකම් සහිත නිවාස නාගරික ජනාවාසයන්හි තවත් පැතිකඩකි. බොහෝ විට නගරයේ ඇති ආන්තික බිම් ඔවුන්ගේ ජනාවාස බවට පත් වේ. ලෝකයේ සැම රටක ම පාහේ නගරවල මුඩුක්කු, පැල්පත් හා අඩු පහසුකම් නිවාස සහිත ජනාවාස මෙන් ම අනවසර ජනාවාස ද දැකිය හැකි ය. නගරයේ පැවැත්මට මොවුන්ගෙන් සේවයක් සිදු වන අතර ම නාගරික ගැටලු රැසක් ද ඔවුන් විසින් නිර්මාණය කරනු ලැබ ඇත.

(නාගරික ජනාවාස වර්ග තුන නම් කිරීමට ලකුණු 03 + නාගරික ජනාවාසයක ලක්ෂණ විස්තර කිරීම සඳහා ලකුණු 03 ලකුණු 06)

iv. ශ්‍රී ලංකාවේ ගැමි නාගරික ජනාවාස ආශ්‍රිත ව හඳුනාගත හැකි ලක්ෂණ තුනක් උදාහරණ සහිත ව විස්තර කරන්න.

ගම හා නගරය අතර පිහිටි සංක්‍රාන්ති කලාපයක් ලෙස මෙය හැඳින්විය හැකිය. ප්‍රාථමික ආර්ථික කටයුතුවල නියුතු පිරිස් ද නගරයේ ද්විතීයක හා තෘතීයක ආර්ථික කටයුතුවල නිරත පිරිස් ද මෙම කලාපයේ ජීවත් වෙති. ගමක ලක්ෂණ මෙන් ම නගරයක ලක්ෂණ ද දැකිය හැකි මෙහි ක්‍රමයෙන් නාගරික ලක්ෂණ වැඩි වෙමින් පවතියි. සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල ගමෙන් පැමිණ නගරයේ රැකියා කරන සාංක්‍රමණිකයන්ගෙන් ගැමි නාගරික කලාපය නිර්මාණය වේ. නගරයේ හර ප්‍රදේශය තුළ ජීවත් වූවෝ නාගරික තදබදයෙන් මිදීමට ගැමි නාගරික කලාපය නේවාසික ප්‍රදේශ වශයෙන් තෝරා ගනිති.

මෙය නාගරික හා ගැමි ජනාවාස අතර පිහිටි සංක්‍රාන්ති කලාපයක් සේ හැඳින්විය හැකි ය. මෙහි ග්‍රාමීය හා නාගරික ලක්ෂණ දෙක ම දක්නට ඇත. ග්‍රාමීය ප්‍රදේශවලින් මෙන් ම නාගරික ප්‍රදේශවලින් ද මේ කරා ජනයා සංක්‍රමණය වෙති. දෛනික සංචලතාව වැඩි ය. වර්තමානයේ නාගරික ප්‍රදේශවල පිහිටි බොහෝ සේවාවන් ස්ථානගත කෙරෙන්නේ ගැමි නාගරික ජනාවාසවල ය. උදා: මහල් නිවාස සංකීර්ණ, සෞඛ්‍ය මධ්‍යස්ථාන, අධ්‍යාපන මධ්‍යස්ථාන, වෙනත් සේවා මධ්‍යස්ථාන

මෙම ප්‍රදේශවල අනුක්‍රමයෙන් ග්‍රාමීය ලක්ෂණ අබිබවා නාගරික ලක්ෂණ මතු වෙමින් පවතී. ගැමි නාගරික ඉතා ගතික ය. එහි බාහිර සීමාව ක්‍රමයෙන් ග්‍රාමීය ප්‍රදේශ කරා තල්ලු වේ.
ශ්‍රී ලංකාවේ ගැමි නාගරික කලාපයට උදාහරණ ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම, අතුරුගිරිය, මහනුවර දිස්ත්‍රික්කයේ පිළිමතලාව, පැණිදෙණිය, ගාල්ල දිස්ත්‍රික්කයේ කොග්ගල, ලබුදූව, කරාපිටිය, ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම, මිනුවන්ගොඩ, නිට්ටඹුව ගත හැකි ය.

(ගැමි නාගරික ජනාවාසයක ලක්ෂණ විස්තර කිරීම සඳහා ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

06).

i. ජන සංඛ්‍යා පිරමීඩයක් යනු කුමක් ද?

රටක ජනසංඛ්‍යාව වයස් ව්‍යූහය හා පුමිතිරි බව අනුව කාණ්ඩ කර ප්‍රස්තාරගත කර දැක්වීමෙන් ජනසංඛ්‍යාවේ ව්‍යූහය පිළිබඳ පුළුල් අදහසක් ලබාගත හැකි ය. මෙම ප්‍රස්තාර පොදුවේ පිරමීඩ ප්‍රස්තාර ලෙස හැඳින්වේ. ජනසංඛ්‍යා පිරමීඩ / වයස් පිරමීඩ ලෙස ද හැඳින්වේ. වයස් කාණ්ඩ අනුව ජනසංඛ්‍යා ව්‍යූහය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් පිරමීඩ මගින් ලබාගත හැක. වයස් පිරමීඩයේ හැඩය මගින් රටක ජනසංඛ්‍යාවේ ප්‍රවණතා හා වෙනත් පුරෝකථනවලට එළඹිය හැකිය.

(යනාදී නිවැරදි හැඳින්වීමකට - ලකුණු 02)

ii. ඉහත A හා B පිරමීඩ වර්ග දෙක නම් කර, ඉන් A රූපයට සමාන ජන සංඛ්‍යා පිරමීඩයක් දක්නට ලැබෙන රටක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න.

A - ප්‍රාථමික B - ප්‍රසාරණ

A ප්‍රාථමික ජන සංඛ්‍යා පිරමීඩය

- පිරමීඩයේ පතුල ඉතා පුළුල් වේ.
- උපත් අනුපාතය ඉහළය.
- කුඩා වයස් කාණ්ඩයේ ජනගහනය වැඩිය.
- මරණ අනුපාතය ද සාපේක්ෂව ඉහළ විය හැක.
- ජීවිත අපේක්ෂාව අඩුය.
- ජනගහනය වේගයෙන් වර්ධනය වේ.
- සංවර්ධනය වෙමින් පවතින රටවල බහුලව දක්නට ලැබේ.
- වයස්ගත ජනගහනය අඩුය.
- රැකියා, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සඳහා වැඩි පීඩනයක් ඇතිවේ.
- නයිජීරියාව, ඇෆ්ඝනිස්ථානය, ඉතියෝපියාව වැනි රටවල

(පිරමීඩ වර්ග දෙක නිවැරදි ව නම් කිරීමට ලකුණ 02 + ලක්ෂණ දෙකක් පැහැදිලි කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iii. C හා D **පිරමීඩ වර්ග දෙක නම් කර, ඉන් ක රූපයට සමාන ජන සංඛ්‍යා පිරමීඩයක් දක්නට ලැබෙන රටක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න.**

C - ස්ථාවර D - හායන

C **ස්ථාවර ජන සංඛ්‍යා පිරමීඩය**

- පිරමීඩයේ මැද කොටස සහ පහළ කොටස සාපේක්ෂව සමාන පළලකින් යුක්ත වේ.
- උපත් අනුපාතය සහ මරණ අනුපාතය දෙකම අඩුය.
- ජනගහන වර්ධනය මන්දගාමී හෝ ස්ථාවර වේ.
- වැඩිහිටි හා වැඩකරන වයස් කාණ්ඩයේ ජනගහනය වැඩිය.
- ජීවිත අපේක්ෂාව ඉහළය.
- සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් හොඳ මට්ටමක පවතී.
- සංවර්ධිත රටවල බහුලව දක්නට ලැබේ.
- ජනගහනයේ වයස් ව්‍යූහය සමබර වේ.
- ස්වීඩනය, ප්‍රංශය වැනි රටවල

(පිරමීඩ වර්ග දෙක නිවැරදි ව නම් කිරීමට ලකුණ 02 + ලක්ෂණ දෙකක් පැහැදිලි කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iv. ඉහත D පිරමීඩයක් දක්නට ලැබෙන රටක ජන සංඛ්‍යාව ආශ්‍රිත ව මතුව ඇති ගැටළු තුනක් සාකච්ඡා කරන්න.

- උපත් අනුපාතය අඩුවීම
- වැඩිහිටි ජනගහනය වැඩි වීම
- ශ්‍රම බලකායේ හිඟය ඇති වීම
- ආර්ථික වර්ධනය මන්දගාමී වීම
- විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ වියදම් වැඩි වීම
- සෞඛ්‍ය සේවා සඳහා වැඩි වියදම් අවශ්‍ය වීම
- බදු ගෙවන තරුණ ජනගහනය අඩු වීම
- පාසල් හා ළමා සේවා අවශ්‍යතාව අඩුවීම
- ජනගහනය ක්‍රමයෙන් අඩුවීම
- ගම්මාන හා කුඩා නගර ජනශූන්‍ය වීම
- ආගමනික ශ්‍රමිකයන් මත රටවල් වැඩි ලෙස රඳා පැවතීම
- නිෂ්පාදන ක්ෂේත්‍රයට කම්කරු හිඟය බලපෑම
- වැඩිහිටි රැකවරණ ගැටළු වැඩි වීම
- රටේ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට අපහසු වීම
- ජපානය, ජර්මනිය, ඉතාලිය වැනි රටවල

(යනාදී ගැටළු තුනක් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

07).

i. එන්ද්‍රීය කෘෂිකර්මය යන්න හඳුන්වන්න.

එන්ද්‍රීය කෘෂිකර්මය යනු පසෙහි, පරිසර පද්ධතිවල ගුණාත්මකභාව හා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය සුරක්ෂිත කරන නිෂ්පාදන ක්‍රියාවලියකි. පරිසරයට පීඩාකාරී යෙදවුම් වෙනුවට එහි පවතින්නේ ස්වාභාවික චක්‍රයන්ට හා ජෛව විද්‍යාත්මක ක්‍රියාවලීන්ට අනුකූල ක්‍රියාවලියකි. එන්ද්‍රීය කෘෂිකර්මය, සම්ප්‍රදාය, නවීනත්වය හා විද්‍යාත්මක අංශ සම්බන්ධ කොට එහි ප්‍රතිලාභ පරිසරයට මෙන් ම එයට සම්බන්ධ ප්‍රජාවට ද ලබා දෙයි.

(යනාදී නිවැරදි හැඳින්වීමකට - ලකුණු

ii. හරිත විප්ලවයෙහි ප්‍රධාන සංරචක තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- උසස් අස්වැන්න ලබාදෙන බීජ වර්ග (HYV seeds) භාවිතය
- රසායනික පොහොර භාවිතය
- කෘමිනාශක හා වල්නාශක භාවිතය
- නවීන වාරිමාර්ග ක්‍රම භාවිතය
- කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය
- බහු වගා ක්‍රම හා කාලීන වගා ක්‍රම අනුගමනය කිරීම
- කෘෂිකාර්මික පර්යේෂණ හා නව තාක්ෂණය
- ගොවීන්ට ණය හා මූල්‍ය පහසුකම් ලබාදීම
- ගොවීන්ට පුහුණුව හා උපදේශන සේවා සැපයීම
- ගබඩා හා ප්‍රවාහන පහසුකම් සංවර්ධනය කිරීම

(සංරචක තුනක් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iii. හරිත විප්ලවයෙහි අවාසි තුනක් සාකච්ඡා කරන්න.

- රසායනික පොහොර හා කෘමිනාශක අධික භාවිතයෙන් පරිසර දූෂණය ඇතිවීම
- පාංශු සාරවත්භාවය අඩුවීම
- ජල දූෂණය හා භූගත ජල මට්ටම් පහළ යාම
- කුඩා ගොවීන්ට වියදම් වැඩි වීම
- විශාල ගොවීන්ට වැඩි වාසි ලැබීමෙන් සමාජ අසමානතාව වැඩි වීම
- ස්වාභාවික බීජ වර්ග නැතිවීම හා ජෛව විවිධත්වය අඩුවීම
- කෘෂිකාර්මික යන්ත්‍ර භාවිතයෙන් රැකියා අවස්ථා අඩුවීම
- රසායනික ද්‍රව්‍ය හේතුවෙන් මිනිස් සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇතිවීම
- එක් වර්ගයක බෝග පමණක් වගා කිරීමෙන් (Mono-culture) අවදානම් වැඩි වීම
- වාරිමාර්ග වැඩි භාවිතයෙන් ලවණීකරණය වැනි ගැටළු ඇතිවීම
- ගොවීන් රසායනික ද්‍රව්‍ය හා වෙළඳ බීජ මත අධික ලෙස රඳා පැවතීම
- දිගුකාලීනව පරිසර පද්ධති වලට හානි සිදුවීම

(යනාදී හරිත විප්ලවයේ අවාසි තුනක් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

iv. එන්ද්‍රීය කෘෂිකර්මයෙහි වාසි තුනක් විස්තර කරන්න.

- පරිසර හිතකාමී වීම
- පාංශු සාරවත්භාවය වැඩි වීම
- රසායනික දූෂණය අවම වීම
- මිනිස් සෞඛ්‍යයට ආරක්ෂිත ආහාර ලබාදීම
- ජල දූෂණය අවම කිරීම
- ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම
- ස්වභාවික පොහොර හා ක්‍රම භාවිතයෙන් පරිසරය සුරක්ෂිත වීම
- දිගුකාලීනව භූමියේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම
- කෘෂිකාර්මික වියදම් සමහර අවස්ථාවල අඩු වීම
- කාබන් විමෝචනය අඩු කිරීමට උපකාරී වීම
- ස්වභාවික පළිබෝධ පාලන ක්‍රම භාවිතා කළ හැකි වීම
- ගොවීන් හා පාරිභෝගිකයන් සඳහා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ඇති කිරීම

(යනාදී එන්ද්‍රීය කෘෂිකර්මයේ වාසි තුනක් විස්තර කිරීම සඳහා ලකුණු 02 බැගින් - ලකුණු 06)

SLGURU.LK
For Educational Purpose Only

08).

i. රටක නාගරීකරණ මට්ටම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

එම රටේ මුළු ජනගහනයෙන් නගර ප්‍රදේශවල ජීවත් වන ජනගහනයේ ප්‍රතිශතයයි. හෙවත්, ග්‍රාමීය ප්‍රදේශවලින් නගර ප්‍රදේශවලට ජනතාව සංක්‍රමණය වී නගර ජනගහනය වැඩිවන ප්‍රමාණය නාගරීකරණ මට්ටම ලෙස හැඳින්වේ. නාගරීකරණ මට්ටම හඳුනා ගැනීමට රටේ සමස්ත ජනසංඛ්‍යාවට සාපේක්ෂ ව නාගරික ප්‍රදේශවල වාසය කරන ජනසංඛ්‍යාව ප්‍රතිශතාත්මක ගණනය කිරීමකට ලක් කළ යුතු ය.

(යනාදී නිවැරදි දැක්වීමට - ලකුණු 02)

රට	නාගරික ජන සංඛ්‍යා ප්‍රතිශතය %	ග්‍රාමීය ජන සංඛ්‍යා ප්‍රතිශතය %
බ්‍රසීලය	88	12
ආර්ජන්ටිනාව	97	07
කොලොම්බියාව	82	18
ජර්මනිය	78	22
ප්‍රංශය	81	19
එක්සත් රාජධානිය	84	16
නයිජීරියාව	54	46
ඊජිප්තුව	43	57
දකුණු අප්‍රිකාව	68	32

මූලාශ්‍රය:UN Population Division / World Bank urban Population Estimates for 2024

ii. ඉහත දත්ත අනුව අප්‍රිකානු රටවල නාගරීකරණය සීමිත වීමට බලපා ඇති සාධක තුනක් විස්තර කරන්න.

- ආර්ථිකයේ පසුගාමී තත්ත්වය සහ ජනතාවගේ අඩු ආදායම
- කාර්මිකරණය අඩුවෙන් සිදු වීම
- කාර්මිකරණය ක්ෂේත්‍රවල ආර්ථිකයක් පවතින බැවින් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව රැඳී සිටීම
- අධ්‍යාපනය හා කුසලතාවයේ අඩුකම
- නගරවල යටිතල පහසුකම් සංවර්ධනය අඩු වීම
- දේශපාලන අස්ථාවරත්වය, යුද්ධ හා ආරක්ෂක ගැටලු
- සේවා සේවා පහසුකම් අඩුවීම
- විදේශ ආයෝජන හා කාර්මික සංවර්ධනය අඩු වීම

(යනාදී සාධක තුනක් පැහැදිලි කිරීමට ලකුණු 02 බැගින් - ලකුණු 06)

iii. දකුණු ඇමරිකානු රටවල හා යුරෝපා රටවල නාගරීකරණ මට්ටම ඉහළ අගයක් ගැනීමට බලපෑ හේතු තුනක් උදාහරණ සහිත ව විස්තර කරන්න.

- කාර්මිකරණය විශාල වශයෙන් සිදු වීම
- ආර්ථිකයේ දියුණුව හා රැකියා අවස්ථා නගරවල බහුලව පැවතීම
- නගරවල යටිතල පහසුකම් (ප්‍රවාහන, ජලය, විදුලිය, සන්නිවේදන, සේවා, අධ්‍යාපන) හොඳින් සංවර්ධනය වීම
- අධ්‍යාපනය හා සේවා සේවා උසස් මට්ටමක පැවතීම
- ජීවන තත්ත්වය නගරවල යහපත් වීම
- ග්‍රාමීය සිට නගරවලට ජනතා සංක්‍රමණය වැඩි වීම
- වෙළඳාම, සේවා කර්මාන්ත හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල වර්ධනය
- ස්ථාවර දේශපාලන තත්ත්වය හා නීතිය හා ආරක්ෂාව

(යනාදී හේතු තුනක් උදාහරණ සහිතව විස්තර කිරීමට ලකුණු 02 බැගින් - ලකුණු 06)

iv. නාගරීකරණයේ අහිතකර බලපෑම් තුනක් විස්තර කරන්න.

- වායු දූෂණය, ජල දූෂණය, ශබ්ද දූෂණය වැඩි වීම
- නාගරික තදබදය හා කසළ බැහැර කිරීමේ ගැටලු
- නිවාස හිඟය හා මුඩුක්කු නිවාස වැඩි වීම
- රථවාහන තදබදය හා අනතුරු වැඩි වීම
- ජල, විදුලි හා අනෙකුත් පහසුකම් සඳහා අධික ගැටලු
- අපරාධ, මත්ද්‍රව්‍ය භාවිතය, සමාජ විකාර වර්ධනය
- රැකියා සඳහා තරඟය වැඩි වීම හා වැටුප් අඩු වීම
- සේවා ගැටලු හා බෝවන රෝග පැතිරීම
- ග්‍රාමීය ප්‍රදේශවල ජනගහනය අඩුවීම හා කෘෂිකාර්මික නිෂ්පාදනයට අහිතකර බලපෑම් සිදු වීම

(යනාදී බලපෑම් තුනක් විස්තර කිරීමට ලකුණු 02 බැගින් - ලකුණු 06)

❋❋❋❋

SLGURU.LK
For Educational Purpose Only

“Tell me and I forget. Teach me and I remember. Involve me and I learn.” — Benjamin Franklin



Visit SLGURU.LK to download papers and notes.